


# දෙල්ඇටයා සහ බඩා

අඩි එකහමාරක් පමණ පළල, අඩි අටක් පමණ දිග උස බංකුව දිගට පුටු පේළිය තබා ඇත. ආනන්ද මා ළඟ ය. මා එතැන කෙළවරේ ය. තම්බයියා මා ඉදිරිපිට බංකුවේ ය. බංකු පේළි දෙකකට ඉස්සරහින් ගැහැනු ළමයින්ගේ බංකු ය. පන්තියේ ළමයින් තිස් දෙකකි. පංතිය තුන ''බී'' පන්තිය යි. පන්තිය භාර ගුරුතුමිය වන මේරිනෝනා ගුරුතුමිය ඉතා කරුණාවන්ත ය. අතේ ඇති වේවැල කිසිවිටක ළමයකුගේ ඇඟට වේගයෙන් වදින්නේ නැත. වැදුණත් ඉතා හෙමිනි. හිනාවෙමිනි. බොහෝ විට වේවැල පාවිච්චි කළේ කළුලෑල්ලේ ලියූ කිසිවක් පැහැදිලි කර දීම සඳහා ය.

අල්ලපු පන්තිය තුන ''ඒ'' පන්තියයි. ''ඒ'' පන්තිය සහ ''බී'' පන්තිය අතර ළමයින්ගේ හැකියාවන් සහ දක්ෂ කම් අතර කිසියම් වෙනසක් ඇති බවට පවතින මතයකි. ''ඒ'' පන්තියේ ඉන්නේ වැඩ පුළුවන් හොඳ ළමයින් ය. ''බී'' පන්තියේ ළමයින් වැඩ බැරි අය ය. ''ඒ'' පන්තියේ පසුවීම උසස් කමක් ලෙස සැලකෙන අතර ''බී'' පන්තිය හෙළා දැක කතා කිරීම ''ඒ'' පන්තිවල ළමයින්ගේ පුරුද්ද ය. තුන ''ඒ'' පන්තිය භාරව සිටින්නේ යූ. එච්. සිල්වා ගුරු මහතා ය. ඔහු අත ඇති වේවැල අපේ පන්තියේ ගුරුතුමියගේ වේවැලට වඩා වෙනස් ය. එම වේවැල් දෙකට පැවරී තිබුණු රාජකාරි දෙයාකාර ය. අප ගුරුතුමියගේ වේවැල නිසල නිවුණු වේවැලක් වුණු අතර, ''ඒ'' පන්තියේ වේවැල නිතර සසල වන සැර වේවැලකි. සමහර විටක ළමයින්ගේ පිටට වැදෙන වේවැල් පාරෙහි ශබ්දය අනිත් ළමයින්ගේ මුහුණු විරූප වී එම පන්තිය වෙතට හැරවෙනසුලු ය.

පිටපත් ලිවීම, කියවන විට ලිවීම, ගණන් සෑදීම, කවි ගායනා කිරීම, මට ඉතාමත් පහසු දේ ය. පන්තියේ වැඩ පුළුවන් හොඳම ළමයා හැටියට නම් වී සිටි නන්දාවතී ගේ ස්ථානය මට අත්වීමට වැඩි දවසක් ගියේ නැත. ගුරු භවතකු අහන ඕනෑම පැනයකට මුලින් ම අත ඔසවා වේගයෙන් වනන්නේ මා ය. මගෙන් ''කොපි'' ගහන්නට බොහෝ දෙනෙකු පුරුදු වූයේ නිරායාසයෙනි. ඒ නිසා දැන් විජේදාස ඇතුළු ළමයින් කීප දෙනෙකු ම මගේ ඇසුර පැතීම මට අස්වැසිල්ලක් විය.

මා කලින් ගිය පාසලේ ''ඉස්කෝලෙ මහත්තයා'' සහ ''ඉස්කෝලේ හාමිනේ'' වෙනුවට අලුත් පාසලේ සිටින්නේ ''සර්'' සහ ''මිස්'' ය. ලොකු මහත්තයා ප්‍රින්සිපල් ය. මට මෙම වචන කටට හුරු කර ගැනීමට ටික දවසක් ගතවිය. ''දැන් ඉස-''කෝලේ මහත්තයා'' සහ ''ඉස්කෝලේ හාමිනේ'' ආමන්ත්‍රණය මගේ දිවගින් ද ඉවත් වෙමින් තිබේ.



ගුරුවරයකු සමග කතා කරන විට, නිතර ම දකුණු අත පපුව කෙළින් ඉහළට ඔසවා කතා කිරීමේ ශික්ෂණය අලුත් පාසලේ ද තිබිණ. ''මිස්, දොට්ට යන්නද?,'' ''මිස්, වතුර ටිකක් බීල එන්නද?'' ''මිස්, අරය මට ගහනව,'' ''මිස්, අරය මට කොලොප්පං කරනව,'' ''සර්, මං කියන්නද?'' මෙවන් වචන අපගේ මුවේ නිරන්තරයෙන් භාවිත වුණු අතර මෙසේ කතා කරන සෑම වාරයක දී ම නිරුත්සාහයෙන් ම අත ඉහළට එසවීම ද සිදු වේ.

පාසලට එන වැඩි දෙනෙකු ඇඳගෙන එන්නේ සරම සහ කමිසයයි. කොට කලිසම සහ කමිසය ඇඳගෙන එන අය ද නොසිටියා ම නොවේ. ගැහැනු ළමයි චීත්ත ගවුම ඇඳගෙන පැමිණෙති. නිල ඇඳුමක් නොතිබුණු අතර, තම වත් පොහොසත්කම අනුව විවිධ පාට, විවිධ රෙදිවලින් මැසූ ඇඳුම්වලින් සැරසී ළමයි පැමිණෙති. බොහෝ අයට ඇත්තේ ''පොප්ලින්'' රෙදිවලින් මැසූ ඇඳුම් ය.

අපගේ පාසලේ දින චරියාව ආරම්භ වන්නේ මිදුලේ ඇති පස් කණ්ඩිය කැපීමෙනි. එම කණ්ඩිය කැපීම අපට විනෝදයක් ගෙනදුන් ක්‍රීඩාවක් බවට පත් වී තිබුණි. පස් අදින ලෑල්ල ඇල්ලීමටත්, ඇදගෙන යාමටත් ළමයි පොර කති. මුල්ලුවලින් ඇන උදැල්ලෙන් කපා ගොඩවල් වන සේ සාදනු ලබන පස්, ලෑල්ලෙන් ඇදගෙන යනු ලැබේ.

පන්සිල් ගැනීමට බෙල් එක ගසන තුරු පස් කැපීමට සිදුවේ. බෙල් ශබ්දය අනුව උදයේ රැස්වීමට එක්වන සියලු ළමයින්, රැස්වීමෙන් පසු පන්තිවලට යාමට ඉතා සීරුවෙන් අරඹන ගමන අඩි තුන හතරකින් ක්‍රමයෙන් වේගවත් වී පන්තිය අසලට යන්නේ දුවගෙන ය. එකවිට ම මුළු පාසල පුරා ම ඇතිවන ඩෙස් පුටු එහෙමෙහෙ ඇදීමෙන් ඇසෙන ශබ්දය ළමයින්ගේ ශබ්දයට මිශ්‍ර වී දෙ-ෝංකාරය දෙගුණ තෙගුණ වෙයි.

අප පන්තියේ මුල් පීරියඩ් එක වතුවැඩ ය. පාසලට පහළින් ඇති විශාල භූමි භාගයේ එක් එක් පන්තිවලට අයත් පාත්ති ඇත. පන්තියේ ළමයින් කීප දෙනෙකුට එක පාත්තිය බැගින් පාත්ති කීපයක් අප පන්තියට අයිති ය. මෙම පාත්තිවල මිරිස්, වම්බටු, බණ්ඩක්කා, මෑ කරල්, ආදිය වගා කරනු ලැබේ. සෑම පාත්තියක ම ඇති වගාවන් සරු ය. තම තමන්ගේ පාත්තිවලින් සරු ඵලදාවක් ලබා ගන්නට ළමයි වෙහෙසෙති. බොහෝ ළමයි උදයේ නිවසින් එනවිට ගොම රැගෙන එති. එකල ගොම පිඩක ඇති වටිනාකම බොහෝ ය. පාරේ හෝ ගොම පිඩක් දුටු කල හබරල අත්තකට හෝ කොළපතකට දමාගෙන පාසලට ගෙන ඒම සිරිතකි. තම තමන්ගේ වගාවන්වලට ගොම පෝර යෙදීමෙන් ලබන අස්වැන්න පිරිසිදු ය. රසායනික පොහොර භාවිතයක් තිබුණේ ම නැත. පාත්තිවල වැටකොළු කරල්, පතෝල කරල් එල්ලෙන චමත්කාරය නැරඹීමට අපගේ දෙනෙත් වැඩි කැමැත්තක් දක්වයි. පොළොන් මෑ එල්ලෙන්නේ සර්පයන් එල්ලී සිටින්නාක් මෙනි. ඉහළට එසවී ඇති ළපටි බණ්ඩක්කා කරල් කඩාගෙන අමුවෙන් කෑමට අපි ප්‍රිය කළෙමු. පිපිඤ්ඤා වැලකට ගෙඩියක් සම්පූර්ණ කර හැඩ බැලීමේ අයිතිය ළමයින් විසින් අහිමි කොට ඇත. පාසල් වත්තේ පහළට ම වන්නට පැලක් සාදා ඇත. එය කවුරු විසින් සාදන ලද්දක් දැයි නොදනිමු. පැල තුළ මැස්සක් ඇත. ගිනි මොළවා නිවුණු ළිපක් තුළ අඟුරු කැබලි, දර කැබලි ආදිය තිබේ. එක හට්ටියක් සහ ඇතිලියක් මැස්ස උඩ මුණින් අතට නවා තිබේ. මේවා පාවිච්චි කරන්නේ කවුද යන්න පිළිබඳ ව අපට දැනුම්වත් කමක් නැත. එහෙත් වරින්වර අප පැමිණෙමින් මේ අසලට වී නොයෙකුත් දේ කතා කරමින්, හොරා පොලිස් කරමින් සිටින්නෙමු.

දැන් විජේදාසත් මගේ යාළුවෙකි. ආනන්ද, තම්බයියා, මුනිදාස යන අප කීපදෙනා එක රොත්තකට පත්වීමට වැඩි දවසක් ගියේ නැත. නොයෙක් විට දඟකාර කම් කරමින් ළමයින්ට උසුළුවිසුළු කරන විජේදාසගේ සහ කිසිවකුට බිය නැති ආනන්දගේ ඇසුරට මා ප්‍රිය කළේ ඔවුන් නිසා අනිත් අයගේ උසුළුවිසුළුවලින් බේරීමට මෙන් ම චණ්ඩිකම්වලින් බේරීමට ඇති හැකියාව නිසා ය.

පාසල් මිදුල මැද ඇති විශාල අඹ ගසෙහි අඹ හැදෙන කාලයට ඉදී වැටෙන ලේන් කොට පාසල් දරුවන්ගේ රසවත් කෑමකි. මෙම අඹ ගසේ විශාලත්වය නිසා ගසට නැග හෝ කෙක්කකින් අඹ කැඩිය නොහැකි ය. සෑම අඹ ගෙඩියකින් ම කොටසක් ලේනුන් විසින් කෑමෙන් පසු ඉතිරි හරිය පාසලේ ළමයින්ට ය. එකල ලෙහෙනකු සපන ලද අඹයක කෑල්ලක් අප කන්නේ බොහෝ ආශාවකිනි. ලේනා කෑ පසු අඹ ගෙඩිය වඩාත් රසවත් යයි අපගේ මතයකි. විෂබීජ සම්බන්ධයෙන් අද මෙන් ප්‍රවේශම් වීමක් එකල නොතිබුණි. අසුවන ඕනෑ ම කෑමක් කෑම අපට හුරුපුරුදු ය. කෑමට පෙර ඕනෑ ම පලතුරක් සෝදා පවිත්‍රකොට කෑමට තරම් අද දරුවන් සෞඛ්‍යය රක්ෂණය අතින් දියුණු ය. එහෙත් එ දවස එවැනි ඕනෑකමක් ගැන අපට එතරම් වැටහමක් නැත. මිදුල අයිනේ ඇති විශාල සිංහල දෙල් ගසින් වැටෙන දෙල් ඇට අපගේ රසවත් ආහාරයකි. දෙල් ඇටවල පොත්ත ගලවා අමුවෙන් ම කෑමට කැමැත්තෙමු. ඒවායෙහි කිරි රස අපට දුන්නේ මධුර රසයකි.

කලින්දා රාත්‍රියේ දී ඇද වැටී ඇති මහා ධාරාණිපාත වර්ෂාවෙන් සමහර ගස් කොළන් බිම වැටී, ගෙඩි බිම වැටී තිබෙන විශේෂත්වයකින් යුතු එක් දිනයකි. මෙය අපට එතරම් හුරු දර්ශනයක් නො වී ය. පාරවල්වල ද අතු රිකිලි අමු ගෙඩි වර්ග පවා වැටී බිම අපිරිසිදුව තිබුණි. ගුරු පාර පුරාවට වතුර පාරවල් ඇදී ගොස් තැනින් තැන කානු හෑරී ඇත. පාසල් වත්තට එනවිට පාසල් වත්තේ ද ඇත්තේ අමුතු ම දර්ශනයකි. මිදුල මැද අඹගසේ ගෙඩි වැටී මිදුල පුරා විසිරී තිබිණි. ඒවායේ ලේන් කොට පමණක් නොව අමු ගෙඩි ද ඇත. අපට මොහොතකට කලින් පැමිණි ළමයින් දෙදෙනෙක් අඹ අහුලමින් අඹ ගස මුල ගොඩ කරන්නේ එක් අතකින් අඹයක් කන ගමන් ම ය. උදයේ ම පැමිණි ''ඒ'' පන්තියේ ජිනදාස සමග මම ද අඹ අහුලන්නට වීමි. ඉදුණු අඹ කමින් දුවමින් මිදුලේ ඇති අඹ අපි වෙනත් වෙනත් තැන්වලින් ගොඩ ගැසුවෙමු.

එවිට ම දෙල් ගස යටට ගිය ජිනදාස අත්පුඩි ගසා අතවනා මට කතා කළේ ය. ඔහුගේ සංඥාව අනුව මම ද දෙල් ගස අසලට ගියෙමි. අපට දෑස් අදහා ගැනීමට බැරි තරම් ය. ඉදුණු දෙල් ගෙඩි බිම වැටී දෙල් ඇට විසිරී ඇත.

අප අත තිබූ අප විසින් ම බාගෙට කන ලද අඹ ගෙඩි දෙක ඉවතට විසිකොට අපි දෙදෙනා ම දෙල් ඇට අහුලන්නට වීමු. දෙල් ඇට හැකිතරම් අහුලා මගේ සරමේ ඔඩොක්කුවට සහ ජිනදාස ගේ කලිසම් සාක්කුවට දමා ගතිමු. එසේ දමා ගන්නා අතර ම අමු දෙල් ඇට කෑවෙමු. අපට ළඟ තබා ගත හැකි ප්‍රමාණය අප ළඟ තබාගෙන අනිත්වා පසුව පැමිණෙන යාළු ළමයින්ට ටික ටික දුන්නෙමු. අප අපට හැකිතරම් අමු දෙල් ඇට කෑවේ මහත් පෙරේතකමිනි.

රාත්‍රියේ දී වර්ෂාව තිබුණ ද උදයේ වර්ෂාව නොතිබූ බැවින් ළමයින්ගේ අඩුවක් ද නොවී ය. වෙනදා සුපුරුදු පරිදි පාසල ආරම්භ විය. පන්තියේ මුල් පීරියඩ් එකේ දී මගේ බඩේ කිසියම් වූ වේදනාවක් දැනෙමින් පැවැතිණි. දෙවැනි පීරියඩ් එක ආරම්භ කොට ටික වේලාවක් යනවිට වේදනාව ක්‍රමයෙන් දැඩි වෙමින් තිබුණි. දැන් නිශ්ශබ්ද ව සිටීමට අමාරු තරම් ය. ටික ටික හීනියට කෙඳිරියක් පිටවන එක නවතාගෙන සිටීමට කෙතරම් උත්සාහ ගත්තත් නොහැකි විණි. කෙඳිරියේ ශබ්දය ද ක්‍රමයෙන් ඉහළ යයි.

පන්තියේ උගන්වමින් සිටි සිංහල මිස් වරින් වර අප දෙස බලයි. ළමයි ද විටින් විට මගේ කෙඳිරිය ගැන විමසිලිමත් වෙති. දැන් පවතින වේදනාව ඉතාමත් ම දැඩි ය.

''අම්මේ... හනේ... අම්මෝ''
''කවුද ඒ මොකද?'' ඒ සිංහල මිස්ගේ විමසීම ය.

ළමයින් මා දෙසට ඇඟිලි දිගුකළා පමණක් නොව ''පියසේන, පියසේන, පියසේන'' යනුවෙන් කීප දෙනෙකුගේ කටහඬවල් ද එකවිට ම පිටවිණි.

''මොකද පියසේන?'' සිංහල මිස් විමසුවා ය.

මගේ කෙඳිරිය මිස මුවින් වචන පිට නොවෙයි. දැන් කටින් කෙරෙන කෙඳිරිය පමණක් නොව දෑසින් ගලන කඳුළු ද ඇත.

39 වන පිටට